# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

# දෙවන වාර පරීක්ෂණය - 2019

| සිංහල I | 13 ශ්‍රේණිය |
|---|---|
| නම/ විභාග අංකය :- ........................................................................<br>පන්තිය :- ................................ | පැය 03<br>විනාඩි 10 යි. |

* පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

- පහත සඳහන් උද්ධෘත අතරින් **හතරක්** තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදා ගන්න.)

01. (අ) බමුණාණෝ ද මළ පුතණුවන් දවාපියා උරගජාතකයෙහි මහබෝසතුන් මෙන් තමන් ශොක නැති වන කාරණ නොදන්නා බැවින් දවස්පතා ම සොහොන් ගොසින් 'අනේ, එක පුතණුවෙනි' යනාදිය කියකියා හඬති. මටකොඩොල් දෙව්පුත් ද තමාගේ දෙව්සැපත් බලා ලබන්ට තිසි ව දෙවන ජාතියෙහි කළ පින්කම් විමසනුයේ බුදුන් කෙරෙහි කළ චිත්තප්‍රසාද පමණකින් වූ නියාව දැන 'මේ බමුණුතෙම තමාගේ වස්තුහානි තකා මාගේ ජීවිතහානියට නිස්ස ම සිතනුයේ බෙහෙත් පමණකුත් නොකරවා ගොයම් කරන අවධියේ නොකොට හිඳපියා වී අවධියේ නොලැබ්බ හැකි විට හඬන්නා සේ එයින් එක් දරුපෙමක් සේ සිතාගෙන සොහොන්හි හඬා ඇවිද්දි. මට මේසා මහත් හානියක් කළ තැනැත්තවුට මෙවිතරෙක් මඳ. තවත් මුසුප්පු උපදවමි'යි මට්ටකුණ්ඩලී වෙස මවාගෙන සොහොන්බිම කරා ගොසින් අත හිස තබාගෙන වැත්තා දන්නට ආ නැකෙනකුන් මෙන් හඬහඬා සිටියේය.

1. බමුණා හඬා වැටෙන්නේ කුමන කරුණක් අරභයාද?
2. දිව්‍ය පුත්‍රයාට දෙව් සැපත ලැබීමේ හේතුව කුමක්ද?
3. මෙම ඡේදයේ සඳහන් ව ඇති උපමාවක් උපුටා දක්වන්න.
4. මෙම ඡේදයෙහි ඇතුළත් ව ඇති ජාතක කථා දෙක කුමක්ද? (ලකුණු 04)

(ආ) ඉක්බිති මඳ ඇසිල්ලකින් ලබනලද ආසවාද ඇති ඒ බ්‍රාහ්මණ තෙම බලවත් රොගයකින් පීඩිත වූ පුරුෂයකු මෙන් කෙඳිරි ගගා රජගෙන් නික්ම තමා වසන ගෙට ගොස් යහළුමිත්‍රයන් කැඳවා ඔවුන්ට කියනුයේ ''එම්බා යහළුවෙනි, යම් කිසි මිත්‍ර කෙනෙක් ආපදර්ථයක් පැමිණි කල්හි තමන්ගේ යහළුවන් අත් නොහැර සමීපයට එළඹ සිටිද් ද දුක්සැප දෙක්හි සම වූ සිත් ඇත්තාහු ද මිත්‍රයන්ගේ යහපත් ගුණය ප්‍රකාශ කෙරෙද් ද ඇසූ කෙනකුන් නිඳා කටයුතු නුගුණයක් ඇත සඟවා වෙසෙද් ද කළමනා කටයුත්තෙහි යොදද් ද නොකළමනා දෙය වළකද් ද මිත්‍රයෝ නමුත් ඔහු මයඃ නැයෝ නමුත් ඔහු මයඃ කාමයෙහි ඉතා ලොල් වූ ස්වර්ණතිලකා නම් සත්‍රියක් තමාගේ තිල්නුවන් නමැති තද වූ ශරප්‍රහාරයෙන් මාගේ සිත් නමැති ශරීරය විද කඩ කඩ කොටපුව, ඇගේ මුඛ නමැති රත්පියුමෙහි ඇලුම් කළාවූ මාගේ නෙත්‍ර නමැති භෘඞගයෝ දෙදෙන මඳකුන් මා සිහි නොකොට ස්වර්ණතිලකාවගේ මුඛ නමැති පද්මයෙහි ම සිත් අලවා වෙසෙති.

1. කල්‍යාණ මිත්‍රයකු සතු ලක්ෂණ දෙකක් මෙම උදධෘතයෙන් උපුටා ලියන්න.
2. නැයෝ වන්නෝ කවරහු ද?
3. ස්වර්ණතිලකාවගේ මුවෙහි ඇලී සිටියේ කුමක්ද?
4. ශර ප්‍රහාරය, ආපදර්ථයක් යන පදවල අරුත් ලියා දක්වන්න. (ලකුණු 04)

(ඇ) පංචසීඛය, තොපි උකුසු වේසයෙන් ආකාශයෙන් ඇවිදුහ. මාතලිය තොප මත්ස්‍ය වේශයෙන් මා යන ඉදිරියට දියෙන් ගොඩ පැන පියව්, මම කට තුබු මාංශය දමා මත්ස්‍යයා ඩැ ගන්ටයෙමි, පංචසිඛය තෝ උකුසු වේසයෙන් මා දමු මාංශ කැටිය ඩැ ගනුව, මාතලිය තෝ මත්ස්‍ය වේශයෙන් දියට පැන පියවයි කියා තුන් දෙන අවුත් ඒ ස්ත්‍රීය සමීපයෙහි පෙනී ගියාහ. කැනහිල් මාංශ කැටියක් ඩැ ගෙන ගඟ සමීපයෙහි ගොඩ අසල යන කලට මත්ස්‍යයෙක් දියෙන් ගොඩට පැනපී ය. කැනහිල් කට තුබූ මාංශ දමා මත්ස්‍යයා ඩැ ගන්ට දිවූ කල මත්ස්‍යයා දියට පැනපී ය. උකුසු මාංශ කැටිය ඩැ ගත, එකියන සිඟාලයා මත්ස්‍යයාත් නො ලැබ මංශ කැටියත් නො ලැබ වික්ෂේප ගඟ සමීපයේ උන් ස්ත්‍රියගේ මූණ බල බලා සිටියේ ය. එවිට ඒ කියන ස්ත්‍රී මහත් කොට සිනාසී පුවාහ. ඊට ශක්‍රයෝ කියන්නාහු මෙතන නැටීමක් ගී කීමක් කෙළි නළුවක් නැතිව මහත් කොට අස්ථානයේ සිනාසුනුයේ කිම්දැයි විචාළේ ය. එවිට ස්ත්‍රී කියන්නී තොප කටින් ඩැ ගෙන ආ මාංශ කැටිය මත්ස්‍යයා කම්යි කටින් දමා මත්ස්‍යයා ඩැ ගන්ට ගිය කලට මාංශ කැටිය උකුසු ඩැගත. මත්ස්‍යයා දියට පැනපී ය. මේ කාරණය දැන සිනාසීම් කිව. එවිට ශක්‍රයෝ කියන්නාහු තොප මට සිනා සෙන්ට කාරණා කිම් ද?

1. ශක්‍ර දේවේන්‍ද්‍රයා මවා ගත් වේශය කුමක් ද?

2. පංචසීඛට ලබා ගන්නට කීවේ මොනවාද?

3. බිසව නිකරුණේ සිනාසුණේ ඇයි?

4. ගී කවක්, කෙළිනළුව යන පදවල අරුත් ලියා දක්වන්න. (ලකුණු 04)

(ඈ) පහත දැක්වෙන උද්ධෘතය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඒ සිටාණන් පියාණෝ, බාරණසෙය්‍යක නම් සිටාණෝ ජීවකයන්ගේ පවත් අසා රජගහ නුවර ගොස් බිම්බිසාර රජ්ජුරුවන් දැක නො එක් සතුටු පඬුරු දී රජහු සන්තෝෂ කරවා පුතණුවන්ගේ ව්‍යාධියෙහි පවත් කියා ජීවකයන් ඉල්වූහ. එ වේලෙහි රජ්ජුරුවෝ ද ජීවකයන් කැඳවා සිටාණන් ආ පවත් කියා ''උන් හා කැටි ව ගොස් උන් පුතණුවන් බලා එව'' යි කියා සිටාණන් හා කැටි ව ම ජීවකයන් යවූහ. ජීවකයෝ ද බරණැස් නුවර ගොස් ව්‍යාධිගත වූ සිටාණන් දැක ඒ ව්‍යාධියෙහි ද නිදන් බලා දිවසින් දුටුවා සේ ම දැක '' සිටාණන් වහන්ස! නුඹ වහන්සේගේ බඩ ගැට ගෙන තිබෙන ගුණයෙක් ඇද්ද'' යි විචාළහ: ඒ බඳු වූ ගුණයෙක් ඇතැ යි කීහ. ක්‍රීඩාවක් කළ දවසෙක සිට ඒ ගුණය ඇති වී දැ යි විචාළහ.

1. අන්තර්ගණ්ඨි ආබාධය යනු කුමක් ද?

2. ''සිටාණන් යටමාලෙහි මැද කප නොසැලෙන සේ බැඳ සිටුවා සිටාණන් මුහුණ වසා පට පිළියක් බැඳ සූක්ෂ්ම වූ සැතක් ගෙන සිටාණන්ට නො දැනෙන සේ බඩෙහි මතු සම් පළා ''බඩවැල් පිටත් කොට'' මම කොටසෙහි අදහස ලිහිල් බසින් ලියන්න.

3. මෙම ඡේදයට අනුව වෛද්‍යවරයෙකු සතු උතුම් ගුණාංගය කුමක් ද?

4. ''ගව මහීෂාදී'' ''සානුමානයෙන්'' යන පදවල තේරුම ලියන්න. (ලකුණු 04)

(ඉ)

සැරයට ළං නොව න
ලිහිණියකු අත් පසුරෙන
ගතිමිය තැන් කර න
එකතු වෙන් ගායනා කෙරෙමින

එ'ද සා තුටු නොව න
එවෙළද දනන්ගෙම න
තුටු කරවන සිහි න
ලිහිල් සැදුමෙන් වෙණ සදා ගෙන

1. විණාවෙහි තත ලිහිල් කොට සාදාගන්නේ ඇයි?

2. මෙම පද්‍යයේ උපමා සහිත පදයක් ලියන්න.

3. ''අත්පසුරෙන'' යන්න ලිහිල් බසින් ලියන්න.

4. වීණා ගායනාව සඳහා කරන උත්සවය නිර්මාණකරුවා දකින්නේ කවර ආකාරයෙන්ද? (ලකුණු 04)

(ඊ) පහත සඳහන් උද්ධෘත අකුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

i) ''මා අතිනුත් මෙහෙ හැරගත මැනවැයි කිවූය.''

ii) ''මේ මා ලද පළමු වන සැපත නුඹ වහන්සේ මා වැඩි පොයොවනික මිලයට ගෙන වදාළ මැනැවැ'

iii) ''මම කීයේ ක්‍රීඩා විනෝදකයෙහි නොඇලෙමි''

iv) ''එම්බා මැණියෙනි, යම් කිසි කෙනෙකුන්ගේ මුහුණ එක් ඇසකින් හොබින්නේ නොවෙයි''

v) ''මම උඹෙන් ගත්තු කෙහෙම්මලක් නෑ. මං අවුරුදු දෙකක් හේන් වැඩ කළා.''

vi) ''ගෙනත් පාමුල තබන බුහුමත - ඒ එකකවත් නොවේ සෙනෙහස''

vii) ''මම පංසලට ගිහින් ආවට කමක් නෑ නේද'' (ලකුණු 3x4=12)

(උ) පහත සඳහන් පද්‍ය කාව්‍ය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

හිරුරැස් විඩාවෙන් පීඩිත කෙසෙල් වතු
සනසා පවන නළවයි දලු රිකිලි අතු
මළහිරු කිරණ සිප ගැවුණ පරිදි ලතු
රන්වන් වුණා පළුගස්වල මහලු පොතු

මැඩියෝ අඬති පෙරළු නව කුඹුරු මඩින්
බස්සෝ ඉගිළි යති නිහඬව හිසට උඩින්
වවුලෝ පියාඹති මී ගෙඩි රැගෙන තුඩින්
ඈ කිසිවිටෙක තැති ගත්ත ද මෙවැනි හඬින්

සෙවණැලි නිදාගති ගම වට කළ බැද්දේ
උණ බට තරඟයට මෙන් එකටෙක මැද්දේ
උකුළෙහි කළය ඉඟ අත තාලෙට පැද්දේ
ඇය එනු බලා වැඩි වෙයි රළවැල සද්දේ

මඟ අස මලාමැලි යුතු තැනිතලා වල
තණගොබ සමඟ පොරකයි නවතලා පැල
කේතකි පඳුරු අතරින් නැඟ සලා ගෙල
ඇය දෙස බලයි නිහඬව සුදු බලා වැළ

හැන්දෑ වලාකුළු නිල් නුබ ඔතා ගති
වැබඩ උණ පඳුරු ඇය ගැන කතා ඇති
රත්සර කැකුළු පෙඳ රැළි මැද ගොතා වෙති
පොබයයි ඇගේ වත නැරඹුම පතා පෙති

දෙසවන අදී වැව් පිටියේ නද	සීරු
පෙඳ රළි පෙනේ ලෙස නිල් වරලස	පීරු
දේදුනු පෑ දියේ තව පීනති	සේරු
පැපත් රළ වළලු ඉන් වෙයි	හුවමාරු

මංකඩ දිලේ විසිතුරු හිරු කිරණ	වැනී
ඇ ඒ එළිය බී මගෙ හදවතට	අනී
දියවැල් ඇගේ පය දූවටී වැලඳ	ගනී
රන්වන් රිදී පෙති වතුරෙන් උඩට	පනී

රැ බෝ වීම මගෙ සතුටට හරස්	වුණා
ඇ මා දැකීමෙන් මඳකට	තිගැස්සුණා
අවිහිංසකව ඒ සමඟම	හිනැස්සුණා
සතරැස පුදුම විදිහට එක ඇසක්	වුණා

02. 'සද්ධර්ම රත්නාවලි කතුවරයා නිර්මාණාත්මක භාෂාව හැසිරීමෙහිලා සුවිශේෂීතාවයකින් යුක්තය' නිර්දිෂ්ය කථා ඇසුරෙන් විමසන්න.

නැතහොත්

ස්ත්‍රී චිත්තය විනිවිද දැකීමට ජාතක කථාකරු සමත් වී ඇති ආකාරය නිර්දිෂ්ට කතා ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

03. අවස්ථා හා සිද්ධි නිරූපණයෙහිලා පූජාවලිය කතුවරයා දක්වූ කුසලතාව නියමිත කතා ඇසුරෙන් පහදන්න.

නැතහොත්

කාමයට ලොල් වීමෙන් පුද්ගල පරිහානිය සිදුවන ආකාරය සද්ධර්මාලංකාරයෙන් විස්තර කෙරේ. නියමිත කතා ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. (අ) සිංහල පද්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ අවධියයි. නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ආ) ගුත්තිල රසවත් කාව්‍යයක් බවට පත්ව ඇත්තේ කතුවරයා යොදාගත් භාෂාවේ සුවිශේෂතාවයයි. නිදර්ශන දක්වමින් විමසන්න. (ලකුණු 08)

05. ප්‍රබලයා විසින් දුබලයා යටපත් කරගන්නා ආකාරය බැද්දේගම නවකතාව පුරාවටම දක්නට ලැබේ. නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. නූතන කෙටිකතාකරුවා තම කෙටිකතා සඳහා විවිධ අනුභූතීන් යොදාගෙන ඇති ආකාරය නූතන කෙටි කතා සංග්‍රහය තුළ දක්නට ලැබේ. නිර්දිෂ්ය කෙටි කතා තුනක් ඇසුරින් විමසන්න. (ලකුණු 15)

07. කොළඹ ද්විතීක යුගයේ කාව්‍ය රචනාවල දැකිය හැකි සුවිශේෂතා පැදි තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

08. සැබෑ ලෝකය සහ සිහින ලෝකය අතර දෝලනය වූ චරිතයක් ලෙස උද්දාල බමුණාගේ චරිතය හැඳින්විය හැකිය. විමසන්න. (ලකුණු 15)